# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 159 — 1975 අප්‍රේල් 11 වැනි සිකුරාදා — 1975.04.11

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (IIආ) වැනි ඡේදය — පළකිරීම්

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 439 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... ... | 444 | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | — | විවිධ දැන්වීම් ... ... | — |


## ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

### රජයේ සැපයීම් දෙපාර්තමේන්තුව

කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ, රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය: තැ. පෙ. 418, කොළඹ 2) පහත සඳහන් සේවයන් සඳහා ඒ ඒ දිනයන්හි පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ:—

| සේවයන් | ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය |
|---|---|
| 1. 1975.05.01 දින සිට 1976.04.30 දක්වා, මෙරට සෑදූ කම්බි ඇණ සැපයීම | 1975.05.06 |
| 2. 1975.05.01 දින සිට 1976.04.30 දක්වා, මෙරට සෑදූ කැරම් සහ දාම් ලෑලි සැපයීම | 1975.05.06 |
| 3. 1975.04.01 දින සිට 1975.09.30 දක්වා, මෙරට සෑදූ ගැල්වනයිස් යකඩ අත් බාල්දි සැපයීම | 1975.05.06. |

ලංකා ප්‍රමිතිවලට අනුකූලව නිෂ්පාදිත භාණ්ඩවලට වැඩි සැලකිල්ලක් දක්වනවා ඇත.

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ ශ්‍රීමත් සිත්තම්පලම් ගාඩිනර් මාවතේ, රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුය.

එක් එක් සේවය සම්බන්ධයෙන් රුපියල් 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් මෙහි ඉදිරිපත් කළ විට ඉහත සඳහන් දිනවලට කලින් දින පෙරවරු 11 වන තෙක් ටෙන්ඩර් පෝරම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

එස්. ඒ. පී. රූපසිංහ,
රජයේ සැපයීම් අධ්‍යක්ෂ.

1975. 04. 11 දින,
කොළඹ දී ය.

4-204—75.04.11 වැනි දින අංක 159 දරන ගැසට් පත්‍රය

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

### විශේෂ නිවේදනයයි

ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදයෙහි පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පළවන සතියට පෙර සතියේ බදාදා දවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් භාරගනු නොලැබේ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 දෙසැම්බර් මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

කොළඹ 5, කිරුළ පාරේ ලංකා ගමනාගමන මණ්ඩලයේ ටෙන්ඩර් මණ්ඩලීය සභාපති තැන විසින් පහත සඳහන් වැඩ සඳහා 30.04.75 වෙනි දින පෙ. ව. 10 වන තෙක් සීල් තබා ඉදිරිපත් කරන ටෙන්ඩර් භාරගනු ලැබේ.

| වැඩ විස්තර | කොන්ත්‍රාත්කරුවන්ගේ අවම ලියාපදිංචි සීමාව |
|---|---|
| | රු. |
| 1. නාගොඩ-කළුතර භූමිය ජිස් කපා සමතලා කිරීම, ඉසී/673 | 100,000.00 |
| 2. ඇඹිලිපිටිය ඩිපෝවේ පාරවල් හා අංගනය තාර දැමීම. ඉසී/579 බී | 100,000.00 |

ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැනගෙන් ලබාගත් ආකෘති පත්‍රවල පිළියෙල කොට අනු පිටපතකින් යුතුව ටෙන්ඩර් පත්‍රිකා ඉදිරිපත් කළ යුතුය. අවශ්‍ය සියලුම විස්තර ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකි අතර, අදාල සැලසුම් ආදිය ඔහුගේ කාර්යාලයේදී පරීක්ෂා කළ හැක. ලංගම, රජයේ දෙපාර්තමේන්තුවල හෝ පිළිගත් සංස්ථාවල සිවිල් ඉංජිනේරු වැඩ සඳහා එක් එක් වැඩයට ඉදිරියෙන් පෙන්වා ඇති හෝ ඊට අධිකව ලියාපදිංචි සිටින කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් පත්‍රිකා එවීමට සුදුසුසෝ වෙති. අවශ්‍ය ටෙන්ඩර් ලියකියවිලි නිකුත් කිරීම සඳහා ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් වැඩ අංක 01 සිට 02 දක්වා රු. 100 ක්ද ආපසු නොගෙවනු ලබන ටෙන්ඩර් ෆෝරම ගාස්තු වශයෙන් වැඩ අංක 01 සිට 02 සඳහා රු. 25 ක් ප්‍රධාන ගිණුම් නිලධාරි තැන වෙත 29. 04. 75 වෙනි දින දහවල් 12 ට හෝ ඊට පෙර ගෙවා, එම කුවිතාන්සිය මාවෙත ඉදිරිපත් කළවිට ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලැබේ. තවද ටෙන්ඩර්කරුවන් සුදුසුසයි පරීක්ෂා කිරීම සඳහා ඔවුන්ගේ සහතික පත් යනාදිය ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළයුතුවේ. ඉහත සඳහන් ටෙන්ඩර් ගාස්තු ප්‍රධාන ගිණුම් නිලධාරි තැන වෙත මුදලින් තැන්පත් කළ හැක්කේ එම සහතික පත් පිළිගනු ලැබුවේ නම් පමණි.

ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැන,
ලංකා ගමනාගමන මණ්ඩලය.

අංක 200, කිරුළ පාර,
කොළඹ, 5.

4-208—75.04.11 වැනි දින අංක 159 දරණ ගැසට් පත්‍රය.

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

පේරාදෙණියේ, රාජකීය උද්භිද උද්‍යානයේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින්, පහත සඳහන් ඒකකවලට මල් පැල සැපයීම සඳහා 1975 අප්‍රේල් මස 24 වැනි දින පස්වරු 2.30 වන තෙක් සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

| ඒකකය | අවශ්‍ය ද්‍රව්‍ය | අවශ්‍ය ප්‍රමාණය |
|---|---|---|
| ජනාධිපති මැදුර උද්‍යානය, කොළඹ ... | ... මැටි මල් පෝච්චිවල රෝපණය කළ 2'ක් පමණ උස හොඳින් වැඩුණු කේන් පාම් පැල ... ... ... | 50 |
| අග්‍රාමාත්‍ය කාර්යාලය අවට උද්‍යානය, කොළඹ | ... මැටි මල් පෝච්චිවල රෝපණය කළ 2'ක් පමණ උස හොඳින් වැඩුණු කේන් පාම් පැල ... ... ... | 100 |
| අරලියගහ මැදුර උද්‍යානය, කොල්ලුපිටිය ... | ... ඩෙන්ඩ්‍රෝබියම් සුපර්බියන්ස් සුපර්බා මල් හටගන්නා ප්‍රමාණයේ පැල ... | 50 |
| | ඩෙන්ඩ්‍රෝබියම් සීසර් රෙඩ් ලිප් මල් හටගන්නා ප්‍රමාණයේ පැල ... | 50 |
| | ඇරැන්ඩා වැන්ඩි ස්කොට් අඩියක් දිග අතු කැබලි ... ... | 50 |

2. ඉහත සඳහන් පැල වර්ග එක් එක් ඒකකයට සම්පූර්ණ ප්‍රමාණයම හෝ අවශ්‍ය පරිදි, 1975 මැයි මස සිට දෙසැම්බර් මස දක්වා, විටින් විට ඇණවුම් කරනු ලබන අතර, ඇණවුම් ලැබෙන පරිදි සැපයිය යුතුයි. ඉහත සඳහන් ද්‍රව්‍යය අවශ්‍ය ඒකකයට ගෙන ගොස් භාරදිය යුතුය.

3. පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ ඕනෑම දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති නිළධාරි කාර්යාලයක රුපියල් 10.00ක මුදලක් තැන්පත් කොට, ඒ සඳහා ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් පත්‍රිකා ලබාගත හැකිය.

4. 1975 අප්‍රේල් මස 23 වැනි දින දවල් 12 වනතුරු, පේරාදෙණියේ, රාජකීය උද්භිද උද්‍යානයේ, උද්භිද උද්‍යාන අධිකාරිවරයාගෙන් ලබාගත හැකි ටෙන්ඩර් ෆෝරම මගින් ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

5. සියළුම ටෙන්ඩර්පත් පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ටෙන්ඩර් බහා එවන කවරයේ වම් කෙළවරේ ඉහළ " මල් පැල සැපයීම සඳහා ටෙන්ඩර් " යනුවෙන් සඳහන් කළ යුතුය. ටෙන්ඩර් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. මේ අන්දමින් සිය ටෙන්ඩර් පත් නොඑවුවහොත්, සීල් තැබූ ටෙන්ඩර් පත් ඔහු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් (ඉහතින් දක්වන ලද විස්තර හා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය එම කවරයේ සඳහන් කර) පේරාදෙණියේ, රාජකීය උද්භිද උද්‍යානයේ, උද්‍යාන අධිකාරිවරයාට හෝ සහකාර උද්භිද උද්‍යාන අධිකාරි වරයාට භාරදිය යුතුය.

6. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේ ටෙන්ඩර් කරුවන්ට පැමිණ සිටීමට ඉඩදෙනු ලැබේ. ඉහත 1 වන ඡේදයේ සඳහන් දින, එකී වේලාවට පේරාදෙණියේ, රාජකීය උද්භිද උද්‍යානයේ, උද්භිද උද්‍යාන අධිකාරිවරයාගේ කාර්යාලයේ දී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ.

7. පත් කරනු ලැබූ ටෙන්ඩර්කරුට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දන්වා දින 10ක් ඇතුළත අවශ්‍ය ඇපය තබා ගිවිසුම අත්සන් කළ යුතුය.

8. තමාගේ ටෙන්ඩරය පිළිගත් බව දැනුම් දෙනු ලැබූ දිනයේ සිට අවශ්‍ය ද්‍රව්‍යය සැපයීමට සෑම ටෙන්ඩර් කරුවෙකුම සූදානමින් සිටිය යුතුය. යම් ටෙන්ඩර්කරුවෙකු මේ අනුව ක්‍රියා කිරීම පැහැර හැරියොත් හෝ එසේ කිරීමට අපොහොසත් වුවහොත්, ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක කර, ඔහුගේ නම කොන්දේසි කඩකළ කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛණයට ඇතුළු කිරීමට සිදුවනු ඇත.

9. ටෙන්ඩර් ප්‍රමාණයන් හා මිළ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර, ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ ඒ තැන්වල ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන් තැබිය යුතුයි.

10. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියළුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමේත්, යම්කිසි කොටසක් පමණක් පිළිගැනීමේත්, බලය පේරාදෙණියේ රාජකීය උද්භිද උද්‍යානයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන සතුය.

11. මේ සම්බන්ධව වෙනයම් විස්තර දැනගැනීමට අවශ්‍ය නම්, පේරාදෙණියේ රාජකීය උද්භිද උද්‍යානයේ, උද්භිද උද්‍යාන අධිකාරිවරයාගෙන් හෝ අදාල ඒකක භාර නිලධාරිගෙන් හෝ දැනගත හැකිය.

ඩී. ටී. ඒකනායක,
උද්භිද උද්‍යාන අධිකාරී.

1975.03.31 වැනි දින,
පේරාදෙණියේ,
රාජකීය උද්භිද උද්‍යාන කාර්යාලයේ දීය.

4-213—75.04.11 වැනි දින අංක 159 දරණ ගැසට් පත්‍රය.

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

පේරාදෙණියේ, රාජකීය උද්භිද උද්‍යානයේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින්, පහත සඳහන් ඒකකවලට ගොම පොහොර ආදිය සැපයීම සඳහා 1975 අප්‍රේල් මස 24 වැනි දින පස්වරු 2.30 වන තෙක් සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

| ඒකකය | අවශ්‍ය ද්‍රව්‍ය | අවශ්‍ය ප්‍රමාණය |
|---|---|---|
| බණ්ඩාරනායක අනුස්මරණ ශාලා උද්‍යානය, කොළඹ ... | ගොම පොහොර ... | ... කියුබ 200 යි |
| | රතු පස් ... | ... කියුබ 150 යි |
| | කළු පස් ... | ... කියුබ 200 යි |
| | $8\frac{3}{4}'' \times 3\frac{5}{8}'' \times 2\frac{1}{4}''$ පුළුස්සන ලද ගඩොල් ... | 10,000 යි |
| | රට උළු ... | ... 2,000 යි |
| | මැටි මල්පෝච්චි $12'' \times 12'' \times 8'' \times \frac{3}{4}''$ ... | 3,000 යි |
| | මැටි මල්පෝච්චි $8'' \times 10'' \times 6'' \times \frac{1}{2}''$ ... | 2,500 යි |
| | මැටි මල් පෝච්චි $5'' \times 7'' \times 4 \times \frac{1}{2}''$ ... | 2,500 යි |

2. ඉහත සඳහන් දේවල් එක් එක් ඒකකයට සම්පූර්ණ ප්‍රමාණයම හෝ අවශ්‍ය පරිදි, 1975 මැයි මස සිට දෙසැම්බර් මස දක්වා, විටින් විට ඇණවුම් කරනු ලබන අතර, ඇණවුම් ලැබෙන පරිදි සැපයිය යුතුයි. ඉහත සඳහන් ද්‍රව්‍යය අවශ්‍ය ඒකකයට ගෙනගොස් භාරදිය යුතුය.

3. පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, හෝ ඕනෑම දි.කෘ.ව්‍යා. නිලධාරි කාර්යාලයක රුපියල් 10 ක මුදලක් තැන්පත් කොට, ඒ සඳහා ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් පත්‍රිකා ලබාගත හැකිය.

4. 1975 අප්‍රේල් මස 23 වැනි දින දවල් 12 වන තුරු, පේරාදෙණියේ, රාජකීය උද්භිද උද්‍යානයේ, උද්භිද උද්‍යාන අධිකාරිවරයාගෙන් ලබාගත හැකි ටෙන්ඩර් පෝරම මගින් ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

5. සියළුම ටෙන්ඩර්පත් පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ටෙන්ඩර් බහා එවන කවරයේ වම් කෙළවරේ ඉහළ '' ගොම පොහොර ආදිය සැපයීම සඳහා ටෙන්ඩර් '' යනුවෙන් සඳහන් කළ යුතුය. ටෙන්ඩර් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. මේ අන්දමින් සිය ටෙන්ඩර් පත් නොඑවූවහොත්, සීල් තැබූ ටෙන්ඩර් පත් ඔහු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් (ඉහතින් දක්වන ලද විස්තර හා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය එම කවරයේ සඳහන් කර) පේරාදෙණියේ, රාජකීය උද්භිද උද්‍යානයේ, උද්‍යාන අධිකාරිවරයාට හෝ සහකාර උද්භිද උද්‍යාන අධිකාරි වරයාට භාරදිය යුතුය.

6. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේ ටෙන්ඩර් කරුවන්ට පැමිණ සිටීමට ඉඩදෙනු ලැබේ. ඉහත 1 වන ජේදයේ සඳහන් දින, එකී වේලාවට, පේරාදෙණියේ, රාජකීය උද්භිද උද්‍යානයේ, උද්භිද උද්‍යාන අධිකාරිවරයාගේ කාර්යාලයේ දී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ.

7. පත් කරනු ලැබූ ටෙන්ඩර්කරුට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දන්වා දින 10ක් ඇතුළත අවශ්‍ය ඇපය තබා ගිවිසුම් අත්සන් කළ යුතුය.

8. තමාගේ ටෙන්ඩරය පිළිගත් බව දනුම් දෙනු ලැබූ දිනයේ සිට අවශ්‍ය ද්‍රව්‍යය සැපයීමට සෑම ටෙන්ඩර් කරුවෙකුම සූදානමින් සිටිය යුතුය. යම් ටෙන්ඩර්කරුවෙකු මේ අනුව ක්‍රියා කිරීම පැහැර හැරියොත් හෝ එසේ කිරීමට අපොහොසත් වුවහොත්, ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක කර, ඔහුගේ නම කොන්දේසි කඩකළ කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛණයට ඇතුළු කිරීමට සිදුවනු ඇත.

9. ටෙන්ඩර් ප්‍රමාණයන් හා මිළ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර, ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත්, ඒ ඒ තැන්වල ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන් තැබිය යුතුයි.

10. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියළුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමේත්, යම්කිසි කොටසක් පමණක් පිළිගැනීමේත්, බලය පේරාදෙණියේ, රාජකීය උද්භිද උද්‍යානයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන සතුය.

11. මේ සම්බන්ධව වෙනයම් විස්තර දනගැනීමට අවශ්‍ය නම්, පේරාදෙණියේ, රාජකීය උද්භිද උද්‍යානයේ, උද්භිද උද්‍යාන අධිකාරි වරයාගෙන් හෝ අදල ඒකක භාර නිලධාරිගෙන් හෝ දනගත හැකිය.

ඩී. ඊ. ඒකනායක,
උද්භිද උද්‍යාන අධිකාරි.

1975 මාර්තු මස 31 වැනි දින,
පේරාදෙණියේ,
රාජකීය උද්භිද උද්‍යාන කාර්යාලයේ දිය.

4–212—75.04.11 දින අංක 159 දරණ ගැසට් පත්‍රය

---

## හිඟුරක්ගොඩ රජයේ ගොවිපොළ 75 යල කන්නයේ ගොයම් පැල සිටුවීම

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම ගොවිපල් අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් ඉහත සඳහන් ගොවිපොලේ පහත සඳහන් කොටස්වල ගොයම් පැල සිටුවීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1975.04.30 වැනි දින පස්වරු 2 දක්වා භාරගනු ලැබේ. ඒ ඒ කොටස්වල ගොයම් පැල සිටුවීම පහත දක්වෙන දිනවල ආරම්භ කළ යුතුය.

| කොටස | පැල වර්ගය | වපසරිය අක්කර | පැල සිටුවීමට පටන් ගතයුතු දිනය | දිනකට අවසන් කළ යුතු අඩුම අක්කර ගණන |
|---|---|---|---|---|
| ඒ ... | එච්. 4 ... | 40 ... | 75.05.06 ... | 10 |
| ඒ 1 ... | අයි.ආර්. 26 ... | 50 ... | 75.05.11 ... | 10 |
| බී ... | බී. ජී. 11–11 ... | 50 ... | 75.05.17 ... | 10 |
| ඊ 1 ... | එල්. ඩී. 66 ... | 35 ... | 75.05.23 ... | 10 |
| සී ... | බී. ජී. 33–2 ... | 20 ... | 75.05.27 ... | 10 |
| සී ... | බී. ජී. 34–8 ... | 60 ... | 75.05.29 ... | 10 |

2. ටෙන්ඩර්කරු භාරගන්නා ලද අක්කර ප්‍රමාණයන් කිසියම් හේතුවක් ඇතොත් අඩු කිරීමට ටෙන්ඩර් මණ්ඩලයට බලය ඇත. එමෙන්ම වර්ෂාව වාරිමාර්ග ජල පහසුකම් හෝ වෙනත් නොවැලැක්විය හැකි කරුණක් ඇති වුවහොත්, ගොයම් පැල සිටුවීමට ආරම්භ කිරීමට නියමිත දිනයක් හෝ පසුව දිනයක් නියම කිරීමට ගොවි පල අධිකාරිට බලය ඇත. ගොයම් පැල සිටුවීමට අවශ්‍ය සියළුම උපකරණ ඇතොත්, එය කොන්ත්‍රාත් කරු විසින් සපයා ගත යුතුය.

3. දිනකට අඩුම වශයෙන් අක්කර 10 ක ප්‍රමාණයේ ගොයම් පැල සිටුවා නිම කළ යුතුය. අවශ්‍ය පැල තවාන් එම කොටස්වලම ඇති අතර, කොන්ත්‍රාත්කරු විසින් පැලවලට කිසිම හානියක් නොවන සේ පැල තවානෙන් ගලවා සිටුවන ලියදිවලට ප්‍රවාහණය කරගෙන ලියද්දේ පේලියෙන් පේලියට අඟල් 9 ක් පරතරය ඇතිවද පේලියේ ගොයම් පැල අතර අඟල් 5 ක පමණ දුරින් ද, එක තැන පැල 3ක් පමණ ද සිටුවිය යුතුය. මුදල් ගෙවීම කරන්නේ ගොවිපල අධිකාරිගේ සෑහීමට පත්වන අක්කර ප්‍රමාණයන්ට පමණය.

4. නියමිත කාලය තුල දී ගොයම් පැල සිටුවීම කළයුතු අතර, නියමිත දින ඉක්මවා පමාවන සෑම දිනයක් සඳහාම දඩ මුදලක් ටෙන්ඩර්කරු විසින් ගෙවිය යුතුය. එම මුදල කෙතෙක් ද යන්න තීරණය කිරීම ටෙන්ඩර් මණ්ඩලය සතුය. ඉහත සඳහන් කර ඇති දිනකට නියමිත අක්කර ප්‍රමාණයේ පැල සිටුවීමට ටෙන්ඩර්කරුට හැකියාවක් තිබිය යුතුය. එමෙන්ම ගොවි පල අධිකාරි සෑහීමට පත්වන අයුරු කොන්ත්‍රාත්තුව ඉටුකල යුතුය. ටෙන්ඩර්කරු පැහැර හැරීමකින් හෝ නොසැලකිලිමත් කමකින් හෝ ගොයම් පැල වලට හානියක් සිදුවුවහොත්, එහි වටිනාකම ටෙන්ඩර්කරුගෙන් අය කරගනු ලැබේ.

5. පේරාදෙණියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ගොවිපල්) කාර්යාලයෙන් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ඒවායේ එවිය යුතුයි. සියළුම ටෙන්ඩර් පත්‍ර දෙ පිටපතකින් යුක්තව නිසි සේ පුරවා සීල් තබා ''සභාපති, ටෙන්ඩර් මණ්ඩලයේ කෘෂිකර්ම ගොවිපල් අංශය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය'' යන්න ලියුම් කවරයේ වම්පස උඩ කෙළවරේ ''හිඟුරක්ගොඩ ගොවිපලේ ගොයම් පැල සිටුවීමේ ටෙන්ඩරය'' යනුවෙන් ලියා එවිය යුතුය.

### ගිස් තාර පිප්ප මිල දී ඉවත් කර ගැනීම

වාරිමාර්ග, විදුලි බල හා මහා මාර්ග අමාත්‍යාංශයේ සබරගමුව දිසාවේ ප්‍රාදේශිය සිවිල් ඉංජිනේරු සංවිධානයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින්, ගිස් තාර පිප්ප මිලදී ඉවත් කර ගැනීම සඳහා ලාංකිකයන්ගෙන් සහ ලාංකික ආයතන වලින් පහත සඳහන් විධියට ඉංජිනේරු කොට්ඨාශ සඳහා වෙන් වෙන් වශයෙන් ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ.

**සි. ඉ. කොට්ඨාශ**

| | |
|---|---|
| (1) රත්නපුර | (6) කලවාන |
| (2) පැල්මඩුල්ල | (7) දෙහිඕවිට |
| (3) බලංගොඩ | (8) යටියන්තොට |
| (4) ගොඩකවෙල | (9) කෑගල්ල |
| (5) ඇඹිලිපිටිය | (10) රඹුක්කන |

2. ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වනුයේ 1975 මැයි මස 6 වෙනි දින උදේ 10 ට වේ. රුපියල් සියයක මුදලක් මෙම කාර්යාලයේ හෝ දිවයිනේ ඕනෑම වැඩ අධ්‍යක්ෂ කාර්යාලයක හෝ කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් සහ තමන් පදිංචි ප්‍රදේශයේ ආදායම් නිලධාරි ලවා සහතික කරවා ගත් වත්කම් පිළිබඳ ප්‍රකාශයක් හෝ තමාගේ වත්කම් ඔප්පු කල හැකි වෙනත් සහතිකයක්, මෙම කාර්යාලයට ඉදිරිපත් කිරීමෙන් පසු 1975.05.05 වන දින සවස 2 වන තෙක් ටෙන්ඩර් පත් ලබා ගත හැක.

3. ටෙන්ඩර් පත් විවෘත කිරීම 1975.05.06 වන දින පෙරවරු 11 ට සබරගමුව දිසා වැඩ අධ්‍යක්ෂ කාර්යාලයේදී සිදු කෙරෙනු ඇත. ටෙන්ඩර් පත් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටිය හැක.

4. කොන්ත්‍රාත්තුව 1975.12.31 වන දිනෙන් අවසන් වන කාල සීමාව සඳහා පමණකි. වැඩි විස්තර රත්නපුර, වැඩ අධ්‍යක්ෂ කාර්යාලයෙන් ලබා ගත හැක.

කේ. වෙල්වරාජා,
වැඩ අධ්‍යක්ෂ—සබරගමු දිසාව.

1975 අප්‍රේල් මස 11 වැනි දින,
වැඩ අධ්‍යක්ෂ කාර්යාලය,
රත්නපුර.

4–126—75.04.11 දින අංක 159 දරණ ගැසට් පත්‍රය

---

### කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**රජයේ ගොවිපලවලට පැළ ලබාගැනීමට සුදුසු අඹ සැපයීම**

පහත සඳහන් සැපයීම සඳහා සිල් තබන ලද ටෙන්ඩර් පත් 1975. 4. 28 දින දවල් 12 දක්වා කොළඹ ගොවිපල් පාලන හා නිෂ්පාදන කාර්යාලයේ සභාපති විසින් භාරගනු ලැබේ:—

පැලකිරීම සඳහා මද ලබාගැනීමට සුදුසු ඉතා හොඳින් පැසුනු වල් අඹ හෝ කොහුඅඹ ගෙඩි 4,00,000 ක් සපයා අරෙපුස්ස ගොවි පලට ගෙනැවිත් භාරදීමට සහ 1,00,000 ක් සපයා වල්පිට ගොවිපලට ගෙනැවිත් භාරදීමට. 1975 මැයි, ජූනි මාස තුළදී මේවා සැපයිය යුතුය.

2. ටෙන්ඩර් ෆෝර්ම මෙම කාර්යාලයෙන් ලබාගතයුතු අතර, එක් ටෙන්ඩර් ෆෝර්මයක් සඳහා රු. 10 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් පේරාදෙනියේ පිහිටි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ හෝ එක්එක් දිස්ත්‍රික්කවල පිහිටුවා ඇති දි. කෘ. ව්‍යා. නි. කාර්යාලයක හෝ මුදලින් තැන්පත් කර මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කල යුතුය.

3. එම ටෙන්ඩර් ෆෝර්ම සම්පූර්ණ කොට කවරයක බහා ලියාපදිංචි කල තැපෑලෙන් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති, ගොවිපල් පාලන හා නිෂ්පාදන කාර්යාලය, තැ. පෙ. 622, පළතුරු කම්හල පාර, කොළඹ 5 යන ලිපිනයට එවිය යුතුය. නැතහොත් ඒවා මෙම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ දැමිය යුතුය. එවනු ලබන කවරයේ වම් කෙලවරේ "අරෙපුස්ස/වල්පිට ගොවිපලට අඹ සැපයීම" යන්න සඳහන් කල යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ඉල්ලුම්කරුවන්ටද පැමිණ සිටිය හැකිය.

5. තෝරාගනු ලබන ටෙන්ඩර්කරු නියෝජ්‍ය අධ්‍යක්ෂ (ගොවිපල්) සමග ගිවිසුමකට ඇතුළත් විය යුතු අතර, ඒ සඳහා මුද්දර ගාස්තු තමන් විසින්ම දැරිය යුතුය.

6. එකී ගිවිසුම අත්සන් කිරීමට පෙරාතුව තෝරාගනු ලබන ටෙන්ඩර්කරු විසින් කොන්ත්‍රාත්තුව නියයාකාර ගෙනයාම සඳහා මුළු මුදලින් සියයට 5 ප්‍රමාණයක මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂ නමින් කෘෂිකර්ම අධ්‍යක්ෂ සරජ් කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කර එම කුවිතාන්සිය මාවෙත ඉදිරිපත් කල යුතුය.

7. ඕනෑම ටෙන්ඩරයක් හෝ සියලු ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමේ හා ටෙන්ඩරයක හෝ ටෙන්ඩර් වල කොටස් පමණක් පිළිගැනීමේ අවසාන බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ සතුවේ.

8. වැඩිමනත් විස්තර අරෙපුස්ස/වල්පිට රජයේ ගොවිපල කළමනාකරුවන්ගෙන් ලබාගත හැක.

එස්. තවරාජවේල්,
ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති,
ගොවිපල් පාලන හා නිෂ්පාදන කාර්යාලය.

1975 අප්‍රේල් මස 1 වැනි දින,
පළතුරු කම්හල් පාරේ, තැ. පෙ. 622,
ගොවිපල් පාලන හා නිෂ්පාදන කාර්යාලය,
කොළඹ 5.

4–186—75.04.11 දින අංක 159 දරණ ගැසට් පත්‍රය

---

### මහවැලි සංවර්ධන මණ්ඩලය—මහවැලි ගඟ සංවර්ධනය

**කලාවැව—මුලකටුව වැව වැඩිදියුණු කිරීම**

උතුරු මැද පලාතේ කලාවැව වම් ඉවුරු ප්‍රදේශයේ මුලකටුව වැව වැඩිදියුණු කිරීම සඳහා, රජයේ දෙපාර්තමේන්තු හා සංස්ථාවන්ගේ රුපියල් 1,00,000 ට ඉහළ සිවිල් ඉංජිනේරු ඉදිකිරීම් කටයුතු පිළිබඳව ලියාපදිංචි වී ඇති දේශිය කොන්ත්‍රාත්කරුවන්ගෙන් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

මෙවැනි ඉදිකිරීම් කටයුතු පිළිබඳව පලපුරුද්දක් ඇති බවට හා අවශ්‍ය යන්ත්‍රෝපකරණ තමා සතුව ඇති බවට සෑහෙන කරුණු ටෙන්ඩර් කරුවන් විසින් ඉදිරිපත් කලවිට කොළඹ 5, ජාවත්ත පාරේ අංක 11, මහවැලි සංවර්ධන මණ්ඩලයේ ප්‍රධාන ඉංජිනේරු (ඉදිකිරීම් සහ ප්‍රගති) තැනගෙන් වැඩ පිළිබඳ වැඩි විස්තර හා පරීක්ෂා කිරීම සඳහා සැලසුම් පත්‍ර ලබාගත හැක.

මහවැලි සංවර්ධන මණ්ඩලයේ ප්‍රධාන ගණකාධිකාරි තැනට රුපියල් හැත්තෑ පහක් (75) ගෙවා ලබාගත් ලදුපතක් ප්‍රධාන ඉංජිනේරු (ඉදිකිරීම් හා ප්‍රගති) ට ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් ලියකියවිලි කට්ටල මුල් පිටපත් තුනක් 1975 අප්‍රේල් මස 15 වැනි දින හා 1975 අප්‍රේල් 28 වැනි දින අතරතුරදී ලබාගැනීමට පුළුවන.

ටෙන්ඩර් පත් භාරගැනීම 1975 අප්‍රේල් 29 වැනි දින උදේ 10ට අවසන් වේ.

ආර්. එස්. කුක්,
සභාපති,
මහවැලි සංවර්ධන මණ්ඩලය.

1975 මාර්තු මස 25 වැනි දින.

4–198—75.04.11 දින අංක 159 දරණ ගැසට් පත්‍රය

**ලංකාණ්ඩුවේ දුම්රිය සේවය**

**වෑගන් විෂයයන් 98ක් සැපයීම සඳහාවූ ටෙන්ඩරය**

අංක 145 හා 75.01.03 දිනැති ගැසට් නිවේදනයේ අමතර වශයෙනි. ඉහත සඳහන් ටෙන්ඩරය සඳහා ටෙන්ඩර් පත් භාර ගැනීමේ අවසාන දිනය 1975 මැයි මස 05 දින දක්වා දීර්ඝ කර ඇත. ටෙන්ඩර් පත්‍රිකා 1975.4.30 වෙනි දින දවල් 12 තෙක් නිකුත් කරනු ලැබේ.

ඇම්. සරීන්,
දුම්රිය සාමාන්‍යාධිකාරී වෙනුවට.

1975 අප්‍රේල් මස 11 දා,
කොළඹ දීය.

4–225—75.04.11 දින අංක 159 දරණ ගැසට් පත්‍රය

---

**කොළඹ වරාය කොමිෂන් සභාව**

කොළඹ වරාය කොමිෂන් සභා ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1975 අප්‍රේල් මස 28 වෙනි සඳු දින පස්වරු 2.30 දක්වා කොළඹ වරාය කොමිෂන් සභාවට අයත් පාවිච්චියට නුසුදුසු ටෙන්ඩර් පත්‍රය සමග නිකුත් කරන ප්‍රමාණ පත්‍රයේ සඳහන් පාවිච්චියට නුසුදුසු රථවාහන සහ අමතර කොටස් ආදිය විකිණීමට හා ඉවත් කර ගත යාම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. 1975 අප්‍රේල් මස 28 වෙනි දින පස්වරු 2.45 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට එහි පෙනී සිටීමට අවසර දෙනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපෑලෙන් නොඑවන අය විසින් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් ටෙන්ඩර් භාරගැනීම සඳහා බලය පවරන ලද නිලධාරියාට ටෙන්ඩර් පත්‍ර පුද්ගලිකව භාරදී ඒ පිළිබඳව එම නිලධාරියාගෙන් කුවිතාන්සියක් ලබාගත යුතුය. නැත හොත් ටෙන්ඩර්කරුවන්ට තමන්ගේ ටෙන්ඩර් දෙපාර්තමේන්තු ටෙන්ඩර් පෙට්ටියෙහි පුද්ගලිකව තැන්පත් කළ හැක.

3. ටෙන්ඩර් පිළිබඳ ලිපි ලේඛන කොළඹ වරාය කොමිෂන් සභා කාර්යාලයේ දී පරීක්ෂා කළ හැක. රු. 250 මුදලක් වරාය කොමිෂන් සභා කාර්යාලයේ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ෆෝරම් කොළ ලබාගත හැක. ටෙන්ඩර් කොන්දේසි වලට අනුව ඇප මුදල ආපසු ගෙවනු ලැබේ.

4. ඉහත සඳහන් අන්දමට ලබාගත් ෆෝරම් කොළවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. 1975 අප්‍රේල් මස 24 වෙනි දින දවල් 12 දක්වා ටෙන්ඩර් ෆෝරම් කොළ නිකුත් කරනු ලැබේ.

ආර්. ඇස්. ද සිල්වා,
වරාය කොමසාරිස්.

කොළඹ වරාය කොමිෂන් සභාව,
කොළඹ 1,
1975.03.31.

4–138—75.04.11 දින අංක 159 දරණ ගැසට් පත්‍රය

---

## බඩු බාහිරාදිය විකිණීම

**වෙන්දේසියේ විකිණීමයි**

අවිස්සාවේල්ල මහෙස්ත්‍රාත් උසාවියට අදාලව රාජසන්තක කරන ලද හා අයිතිකරුවන් විසින් රැගෙන ගොස් නොමැති බයිසිකල්, උදලු, ඉල්ලන්කුරු, ප්ලාස්ටික් භාජන, කුඩා ආදී භාණ්ඩ වර්ග කිපයක් 1975. 04. 26 දින ප. ව. 2.00 ට අවිස්සාවේල්ල මහෙස්ත්‍රාත් උසාවි භූමියේ දී වෙන්දේසියේ විකුණනු ලැබේ.

භාණ්ඩ මිලදී ගත් වහාම මුදල් ගෙවා, එවේලේම එම භාණ්ඩ උසාවි භූමියෙන් ඉවත් කර ගත යුතුය.

භාණ්ඩ ලැයිස්තුවක් 1975. 04. 11 දින සිට අවිස්සාවේල්ල මහෙස්ත්‍රාත් උසාවියේ දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කරනු ඇත. විකිණීමට නියමිත භාණ්ඩ 1975. 04. 26 දින පෙ. ව. 10.00 සිට බැලිය හැක.

රූ. මො. වීරසූරිය,
රෙජිස්ට්‍රාර් තැන.

1975. 03. 21 දා,
අවිස්සාවේල්ල මහාධිකරණයේදීය.

4–157—75.04.11 දින අංක 159 දරණ ගැසට් පත්‍රය

---

**ගාල්ලේ අධ්‍යාපන දෙපාර්තමේන්තුව—වෙන්දේසි දැන්වීමයි**

ගා/විද්‍යාලෝක මහා විද්‍යාලයට පවරා ගෙන ඇති ඉඩමේ තිබෙන පාවිච්චියට ගත නොහැකි ගෙවල් පේලිය 1975 මැයි මස 02 දින පෙරවරු 10 ට ම විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. සතියක් තුලදී බඩු බාහිරාදිය හා සුන්බුන් ඉවත් කර ස්ථානය පිරිසිදු කළ යුතුය.

3. මුදල් එවෙලේම ගාල්ලේ අධ්‍යාපන කාර්යාලයට ගෙවිය යුතුය.

4. වැඩි විස්තර මෙම කාර්යාලයේ ගොඩනැගිලි ශාඛාවෙන් කාර්යාල වේලාවන් වලදී දැනගත හැක.

ඩබ්ලිව්. ඩී. ප්‍රනාන්දු
ගාල්ලේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ.

1975 මාර්තු මස 31 දින,
ගාල්ලේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදීය.

4–181—75.04.11 දින අංක 159 දරණ ගැසට් පත්‍රය

---

**රේගු වෙන්දේසියක්**

පහත සඳහන් භාණ්ඩ 1975 අප්‍රේල් මස 29 වැනි දින පෙරවරු 9.30 ට කොළඹ ශ්‍රී ලංකා රේගුවේ, එෆ්–2 විකුණුම් ගුදමේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

1975 අප්‍රේල් මස 28 වැනි දින පෙරවරු 9.30 සිට පස්වරු 1.00 දක්වා ගැණුම් කරුවන්ට මෙම භාණ්ඩ පරීක්ෂාකර බැලීමට පිළිවන.

යම් භාණ්ඩයක් විකුණා අවසන්වූ වහාම එම භාණ්ඩ මිලදීගත් තැනැත්තා විසින් ඊට අදල සියයට පනහක (50%) මුදලක් තැන්පත් කළ යුතුය.

වෙන්දේසිය පිළිබඳ අනෙකුත් කොන්දේසි සඳහා 1954 මැයි මස 28 වැනි දින අංක 10,675 දරණ ගැටස පත්‍රය බලන්න.

කේ. පී. ඇල්. පී. නානායක්කාර,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

1975.03.31 වැනි දින,
නිවාරණ කාර්යාලය,
ශ්‍රී ලංකා රේගුව,
කොළඹ.
මගේ අංකය : නිවාරණ/විකිණීම/33/75,

1. ලෝහ කොණ්ඩා කටු පැකට් 20 (එකක් ග්‍රෝස් 1 යි), සෙල්ලම් ඔර්ලෝසු 100 ක්, ප්ලාස්ටික් කොණ්ඩා කටු 208 ක්,

2. හිසමුදුනේ ආලේප කිරන ටොනික් බෝතල් 2 ක් (කේසුව රානී වර්ග)ය, රන්පැහැති කොණ්ඩා පළඳනා 345 ක්

3. ලන්තෑරුම් තිර 137 ක් (බයිසිකල් ලකුණ දරණ 5/8,7/8,½), කළු පබලු පොකුරු 14 ක්, සෙල්ලම් මැඩල්ස් 90 ක්, රන්පැහැති කෝඩ් පොකුරු 116 ක්, රන්පැහැති ලෝහ මුදු 200 ක්, රන් පැහැති ලෝහ මුදු පැකට් 27 ක් (එකක් ග්‍රෝස් ½), විනිවිද පෙන්නුම් කරන විදුරු කොපු 136 ක්, ඔර්ලෝසු විදුරු 185 ක්,

4. ලෝහ ඔර්ලෝසු පටි 2 ක්, පැට්රෝල් මැක්ස් ලාම්පු නිප්ල් පැකට් 7 ක් (ග්‍රෝස් 2 පැකට්), ඉන්දියාවේ සාදන ලද උල්පත් පෑන් 2 ක්.

5. ඇලුමිනියම් දම්වැල් පොකුරු 110 ක්, ලෝහ කොණ්ඩා කටු පැකට් 6 ක් (ග්‍රෝස් 5½ ක් පමණ)

6. ජිප්සි කන්තෝඩු කුට්ටම් 24 ක්, අව් කණ්නාඩි 2 ක්, ප්ලාස්ටික් අයිටෙක්ස් පෙට්ටි 7 ක්.

7. සන්යෝ කැසට් ගුවන් විදුලි යන්ත්‍ර 1 ක්.

8. නැෂනල් පැනසොනික් ට්‍රාන්සිස්ටර් ගුවන් විදුලි යන්ත්‍ර 1 ක් ඒසී/ඩීසී.

9. මෝටර් ස්ටාටර් 7ක් සහ ප්‍රෙෂර් ප්ලේට් 1 ක්, සස්පෙන්ෂන්ස් 2ක්

10. මෝටර් පිනියන්ස් 3 ක්

11. ඔස්ට්‍රේලියාවේ සාදන ලද මැරින් තීන්ත ටින් 15 ක්, (එකක ගැලුම් 5 ක් ඇත. එකක් කැඩී තීන්ත විසිරී ඇත)

12. බලැන්සස් පැකට් 18 ක්, තුවා 1 ක්

13. ස්පාඤ්ඤයේ සාදන ලද රසදිය සිලින්ඩර්ස් 4 ක් (එකක් රා. 60 කි)

14. තීන්ත ටින් 1 ක් (කැඩී බිඳී ඇත)

15. ලෝහ කොණ්ඩා කටු 400 ක්, ලෝහ කොණ්ඩා කටු පැකට් 18 ක් (එකක ග්‍රෝස් 1 කි)

16. නෝනා මහත්මීන්ගේ ටී ෂර්ට් 8 ක්

17. කමිස 22 ක් (පරණ සහ පලුදු වී ඇති),

18. ගුවන් විදුලි යන්ත්‍ර පින්පොලේ කනැක්ෂන් 2 ක්, ඉන්දියාවේ සාදන ලද උල්පත් පැන් 2 ක්

19. පටි 1ක්, සාරි 2 ක් (පලුදුවූ), මාටෙනල් රෙදි පිස් 1 ක්,

20. චීනයේ සාදන ලද උල්පත් පැන් 42 ක්,

21. සෙරෙප්පු ජෝඩු 95 ක්, කුඩා ළමුන්ගේ සපත්තු සහ සෙරෙප්පු ජෝඩු 38 ක්, මහතුන්ගේ සහ නෝනා මහත්මීන්ගේ ජෝඩු 44 ක්, රබර් සෙරෙප්පු 13 ක්, රෙඩියන්ට්වේ පොත් 87 ක්, සැප්තැම්බර් 1 වැනි දින, රෙඩියන්ට්වේ පොත් 67 ක් සැප්තැම්බර් 2 වැනි දින, පාඨශාලා පොත් දමන බෑග් 1 ක්, විදුලි මීටර් 1 ක්, පාපැදි මඩ ආවරණ 24 ක්, වීදුරු බෝල 100 ක් පමණ, පුවක් කපන ගිර 12 ක්, මිනිරන් පාර්සල් 1 ක් (රාත්තල් 4 ක් පමණ බර). ලියුම් කවර පැකට් 10 ක් (එකක 50 ක් ඇත.) පාපැදි සීනු නොමැති අමතර කොටස් දුසිම් 3 ක්, පාපැදි බරේක් පතුරු දුසිම් 4 ක්, පාපැදි බරේක් ඇන සම්පූර්ණ පෙට්ටි 2 ක් (දුසිම් 6 ක්)

22. චීනයේ සාදන ලද උල්පත් පැන් 14 ක්

23. මහතුන්ගේ කැමී වර්ගයේ ඔර්ලෝසු 2 ක්
මහතුන්ගේ කැමී වර්ගයේ ඔර්ලෝසු 2 ක්, මහතුන්ගේ කාස්ලටස් ඔර්ලෝසු 2 ක්, මහතුන්ගේ එරෝනා ඔර්ලෝසු 1 ක්

24. නෝනා මහත්මීන්ගේ සිටිසන් ඔර්ලෝසු 1 ක්

25. මහතුන්ගේ කැමී වර්ගයේ ඔර්ලෝසු 1 ක්
මහතුන්ගේ එනිකා වර්ගයේ ඔර්ලෝසු 1 ක්
ඇටකෝ වර්ගයේ ඔර්ලෝසු 1 ක්
} සම්පූර්ණයෙන්ම පලුදුවී ඇත

26. ඔර්ලෝසු 3 ක්

27. සීකෝ ඔර්ලෝසු 1 ක්, සිටිසන් ඔර්ලෝසු 1 ක්,

28. පෙලිසීලර් මැෂින් පැකේජස් 4 ක්, හයිපොක් පොලිසීලර් යුනිවර්සල් ෂිල්ට් සීලර් පාකුරා සිලින් මැෂින්

29. නැෂනල් පැනසොනික් ට්‍රාන්සිස්ටර් ගුවන් විදුලි යන්ත්‍ර 1 යි, ආර්. 441 බී

30. නැෂනල් පැනසොනික් ට්‍රාන්සිස්ටර් ගුවන් විදුලි යන්ත්‍ර 1 යි ආර්. 306

31. නැෂනල් පැනසොනික් ට්‍රාන්සිස්ටර් ගුවන් විදුලි යන්ත්‍ර 1 යි, ආර්. 439

32. පදින බෝට්ටු 1 ක් ජේ.31, මැක්ලම් ලොක්ස්හි නවතා ඇත.

33. පදින බෝට්ටු 1 ක් ජේ. 43 මැක්ලම් ලොක්ස්හි නවතා ඇත.

34. හොණ්ඩා මෝටර් බයිසිකල් 1 ක්

35. විදුලි ඉස්ත්‍රික්ක 1 ක් (මළබැඳී ඇත).

36. පාපැදි ෆ්‍රේම් අමතර කොටස් (225 ක්)

4–185—75.04.11 දින අංක 159 දරණ ගැසට් පත්‍රය

---

## අනුරාධපුර මහෙස්ත්‍රාත් උසාවිය—දූව හා දූව භාණ්ඩ වෙන්දේසිය

අනුරාධපුර මහෙස්ත්‍රාත් උසාවියේ පැවරූ නඩු හා සම්බන්ධ රාජසන්තක කල/හිමිකම් නොකියූ පහත දක්වෙන භාණ්ඩ සම්බන්ධයෙන් 1975 මැයි මස 9 වෙනි සිකුරාද පස්වරු 1.00 ට අනුරාධපුර මහෙස්ත්‍රාත් උසාවියේ භූමියේ දී වෙන්දේසියේ විකුනනු ලැබේ.

| | නඩු අංකය | | භාණ්ඩය |
|---|---|---|---|
| 1. | බී. 313/73 | ... | බුරුත කොට 15 ක් හා පලු කොට 1 ක් |
| 2. | ඒ. 260/73 | ... | බුරුත කොට 16 ක් |
| 3. | ඒ. 136/73 | ... | බුරුත කොට 1 ක් හා හුරිමාර කොට 2ක් |
| 4. | 26411 | ... | බුරුත කොට 18 ක් |
| 5. | ඒ. 871/68 | ... | කොට 19 ක් |
| 6. | ඒ. 967/68 | ... | පරාල 6ක් හා ඉරන ලද ලෑලි 2 ක් |
| 7. | 35939 | ... | තේක්ක කොට 3ක් |
| 8. | 37189 | ... | ඉරන ලද ලෑලි 3ක් |
| 9. | 37410 | ... | ඉරන ලද ලෑලි 20ක් |
| 10. | ඒ. 2298/70 | ... | පලු කොට 6ක් |
| 11. | 37177 | ... | පලු ලෑලි 10 ක් |
| 12. | 37179 | ... | පලු ලෑලි තොගයක් |
| 13. | 37957 සහ 37954 | ... | බුරුත කොට 6 ක් |
| 14. | 38884 | ... | පරාල 45ක් |
| 15. | 38311 | ... | බුරුත කොට 3ක් |
| 16. | ඒ. 270/71 | ... | තේක්ක කොට 5 ක් සහ බුරුත කොට 7ක් |
| 17. | ඒ. 1152/69 | ... | බුරුත කොට 4ක් |
| 18. | 31847 | ... | ඉරන ලද දැව කැබලි 16 ක් |
| 19. | ඒ. 1156/72 | ... | පලු ලී කැබලි 1 ක් සහ හැලඹ රිප්ප. 12 |
| 20. | 44896 | ... | ඉරන ලද දැව කැබලි 17ක්, පරාල 2ක් |
| 21. | 45229 | ... | වැවරන කොට 2 |
| 22. | ඒ. 487/74 | ... | තේක්ක කොට 1 හා පරාල ඉරන ලද ලෑලි 16 |
| 23. | 58092 | ... | ලෑලි හතරක් |
| 24. | ඒ. 681/73 | ... | ලාච්චු දෙකේ මේසයක් |
| 25. | 53208 | ... | දොරක් සහිත උලුවහු 1 ක් |
| 26. | ඒ. 941/73 | ... | පරන දොරපලු 1 ක් |
| 27. | 37468 | ... | අබලන් ෂෝකේස් එකක් |
| 28. | 38181 | ... | දොරපලු 3 ක්<br>උලුවහු 3ක්<br>කැඩුනු ඇස්බැස්ටෝස් තහඩු 25ක් |
| 31. | 32146 | ... | කැරම් බෝඩ් 1 ක්<br>ටියුබ් ලයිට් 1 ක් හා නැමුනු තහඩු 1 ක් |
| 32. | 46147 | ... | දොරවල් රහිත උලුවහු 1 ක් සහ දොරවල් රහිත ජනෙල් 1 |
| 33. | බී. 1886/72 | ... | ජනෙල් විදුරු තොගයක් |
| 34. | 45255 | ... | උලුවහු.ලී 3 ක් |
| 35. | 45444 | ... | පිලි සහිත ඇලුමිනියම් තහඩු 3 ක් හා පිලි රහිත 3 ක් |
| 36. | 57748 | ... | දොර උලුවහුවක් හා ජනෙල් රාමුවක් |
| 37. | 53044 | ... | ඇඳක් |
| 38. | 130/69 | ... | කුඩා විදුරු ෂෝ කේස් එකක් |
| 39. | බී. 345/73 | ... | යකඩ කූරු තොගයක් |
| 40. | ඒ. 1275/72 | ... | දර සඳහා සුදුසු මිශ්‍ර දැව කැබලි |
| 41. | | ... | ටින් තහඩු ඇතුලු විවිධ ගොඩනැඟිලි ද්‍රව්‍යයන් |

(අ) මේ භාණ්ඩ වෙන්දේසියට කලින් බැලීමට අවශ්‍ය නම් අනුරාධපුර මහෙස්ත්‍රාත් උසාවියේ රෙජිස්ට්‍රාර්ගේ අනුමැතිය ඇතිව වෙන්දේසිය ඇරඹීමට පැයකට කලින් පරීක්ෂා කර බැලිය හැක.

(ආ) බඩු මිලයට ගන්නා සෑම අයෙක්ම සම්පූර්ණ මුදල ගෙවා වෙන්දේසිසිය අවසානයේ භාණ්ඩ ඉවත් කර ගත යුතුය.

(ඇ) චෙක් පත් මගින් නොව අත්පිට මුදලින් පමනක් සෑම ගෙවීමක්ම කල යුතුය.

ලෙස්ලි අබේසේකර,
මහෙස්ත්‍රාත්, අනුරාධපුර.

1975.03.31 වෙනි දින,
අනුරාධපුර මහෙස්ත්‍රාත් උසාවියේ දීය.

4—210—75.04.11 දින අංක 159 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළ කරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා නිවේදන භාර ගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛණයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වෙනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙලින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

**1975**

| මාසය | පළ කිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|
| මාර්තු ... | 07.03.75 | සිකුරාද ... | 26.02.75 | බදාද | දවල් 12.00 |
| | 14.03.75 | සිකුරාද ... | 05.03.75 | බදාද | දවල් 12.00 |
| | 21.03.75 | සිකුරාද ... | 12.03.75 | බදාද | දවල් 12.00 |
| | 27.03.75 | බ්‍රහස්පතින්ද ... | 19.03.75 | බදාද | දවල් 12.00 |
| අප්‍රේල් ... | 04.04.75 | සිකුරාද ... | 25.03.75 | අඟහරුවාද | දවල් 12.00 |
| | 11.04.75 | සිකුරාද ... | 02.04.75 | බදාද | දවල් 12.00 |
| | 18.04.75 | සිකුරාද ... | 09.04.75 | බදාද | දවල් 12.00 |
| | 24.04.75 | බ්‍රහස්පතින්ද ... | 16.04.75 | බදාද | දවල් 12.00 |
| මැයි — | 02.05.75 | සිකුරාද — | 23.04.75 | බදාද | දවල් 12.00 |
| | 09.05.75 | සිකුරාද ... | 30.04.75 | බදාද | දවල් 12.00 |
| | 16.05.75 | සිකුරාද ... | 07.05.75 | බදාද | දවල් 12.00 |
| | 23.05.75 | සිකුරාද ... | 14.05.75 | බදාද | දවල් 12.00 |
| | 30.05.75 | සිකුරාද ... | 21.05.75 | බදාද | දවල් 12.00 |
| ජූනි ... | 06.06.75 | සිකුරාද ... | 28.05.75 | බදාද | දවල් 12.00 |
| | 13.06.75 | සිකුරාද ... | 04.06.75 | බදාද | දවල් 12.00 |
| | 20.06.75 | සිකුරාද ... | 11.06.75 | බදාද | දවල් 12.00 |
| | 27.06.75 | සිකුරාද ... | 18.06.75 | බදාද | දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1975 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී